- දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලට පිවිසීමට ප්‍රථම සියලු දෙනා දෑත් පිරිසිදු කිරීමට සකසා ඇති ස්ථාන වලින් දෑත් පිරිසිදු කර ගතයුතු අතර, මුහුණු ආවරණ පැළඳ සිටිය යුතුය.
- කාර්යාල පරිශ්‍රයට පිවිසීමට පෙර සියලු දෙනාගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කරනු ලබන අතර, ඒ සඳහා සියලු දෙනා සහය ලබාදිය යුතුය. එහිදී ශරීර උෂ්ණත්වය ෆැරන්හයිට් 98.4 (98.4 °F) හෝ සෙල්සියස් අංශක 37 (37 °C) ට වැඩි පුද්ගලයින් හට කාර්යාල පරිශ්‍රයට පිවිසීමට ඉඩ ලබා දෙනු නොලැබේ.
- කැස්ස, උණ, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ වේදනාව, ඇඟපත වේදනාව, හුස්මගැනීමේ අපහසුතා යන Covid 19 වෛරස් රෝග ලක්ෂණ එකක් හෝ කිහිපයක් පවතින පුද්ගලයින්, Covid 19 වෛරස් රෝගියකු සමග අවසාන දින 14 තුල ලඟින් ඇසුරු කල පුද්ගලයින්, ස්වයං නිරෝධායනයට ලක්කොට ඇති පුද්ගලයින් සේවා ලබා ගැනීමට නොපැමිණිය යුතුය.
- දිනක් තුල සේවාව ලබාදීම සිදුකරනු ලබන්නේ සීමිත සේවාලාභින් ප්‍රමාණයකට වන බැවින් සෑම විටම පුද්ගලයින් අතර පරතරය මීටර 1 ක් වන සේ පවත්වා ගනිමින් තම සේවාව ලබා ගත යුතුය.

- ඉහත සඳහන් කරුණුවලට අමතරව සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ, කාර්යාලයේ අධීක්ෂණ නිලධාරීන් ලබා දෙන උපදෙස් සහ කාර්යාලයීය පරිශ්‍රයේ ප්‍රදර්ශනය කොට ඇති මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය.